| පිළියන්දල අධ්‍යාපන කලාපය<br>**Education Zone - Piliyandala** | | | |
|---|---|---|---|
| වර්ෂ මැද ඇගයීම - 2017<br>**Mid Year Evaluation** | | | |
| ශ්‍රේණිය<br>**Grade** } 11 | විෂයය<br>**Subject** } ඉතිහාසය | පත්‍රය<br>**Paper** } I | කාලය<br>**Time** } පැය 01යි |

නම .............................................. විභාග අංකය ....................

සැළකිය යුතුයි:

- සියලුම ප්‍රශ්න වලට පිලිතුරු සපයන්න. මෙම කොටස සඳහා ලකුණු 80කි.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්න වලදී දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා දි ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුල (×) ලකුණ යොදන්න.
- සැපෙයෙන පිළිතුරු පත්‍රයේ පිටු පස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවාද පිළිපදින්න.

01) **ලංකාවේ ඉතිහාසය හැදෑරීමට උදව්වන සාහිත්‍ය මුලාශ්‍ර අතර මහාවංශයට ප්‍රමුඛස්ථානයක් හිමිවීමට ප්‍රධාන හේතුව නම්,**

1. වෙනත් වංශකතා වල ඇති අඩුපාඩු මගහරවා රචනා කිරීම ය
2. එතෙක් තිබූ අට්ඨ කතා හා පිංපොත් උදව් කර ගැනීම ය
3. අඛණ්ඩ ඉතිහාසයක් ගොඩනගා ගත හැකි වීමය
4. ප්‍රධාන වශයෙන් ආගමික ඉතිහාසයක් හැදෑරීමට හැකිවීමය

02) **ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය ගැන තොරතුරු සොයන්නෙකුට වඩාත් වැදගත් වන මූලාශ්‍රය මින් කුමක්ද?**

1. අභිලේඛණ 2. ජනකතා 3. ගුහාචිත්‍ර 4. ගල් මෙවලම්

03) **අපේ පුරාවස්තු රැකගැනීම වඩාත් වැදගත්වන්නේ ඒවා ,**

1. අතීතයට අයත් දේවල් නිසාය
2. මිළ කළ නොහැකි දේවල් නිසාය
3. දේශිය උරුමය ප්‍රදර්ශනය කිරීමට හේතුවන නිසාය
4. විදේශ සංචාරකයන්ට පෙන්විය හැකි නිසාය

04) **ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ පරිසර කලාප අනුව පහතරට තෙත් කලාපයට අයත් ස්ථාන දෙකක් ලෙස වැදගත්වන ස්ථාන වන්නේ,**

1. පාහියන්ගල හා කිතුල්ගල බෙලිලෙන
2. බුන්දල හා බෙල්ලන් බැඳි පැලැස්සයි
3. සීගිරිය පොතාණ හා අලිගල
4. බණ්ඩාරවෙල හා හෝර්ටන් තැන්නයි

05) **ගස් ගොලුබෙල්ලන් හා කලපුවල ජීවත් වන බෙල්ලන් ආහාරයට ගැනිමට වඩාත් රුචිකත්වයක් දක්වා ඇත්තේ ,**

1. ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයාය
2. පූර්ව ඓතිහාසික යුගයේ මානවයාය
3. මුල් ඓතිහාසික යුගයේ මානවයාය
4. ඓතිහාසික යුගයේ මානවයාය

06) **දෙකට බෙදන සේ සිදුරු විදින ලද මිනිස් හිස් කබලක් හමුවී ඇත්තේ,**

1. රංචාමඩම ප්‍රදේශයෙනි    2. රාවණාඇල්ල ගල්ගුහාවේන්
3. කිතුල්ගල බෙලිලෙනෙනි    iv . පාහියන්ගල ගල්ගුහාවෙනි

07) **ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයට අයත් ශිලා මංජුසා සොහොන් හමුවී ඇති ස්ථාන දෙකක් වන්නේ කුමක්ද?**

1. පිදුරංගල හා අලිගල    2. පොකාන හා රත්නපුර
3. මානියම්ගොඩ හා පතිරාජවෙල    4. ඉබ්බන් කටුව හා යටිගල් පොත්ත

**08 සිට 11 තෙක් ප්‍රශ්න වල හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ කුමක්දැයි තෝරන්න,**

08) **මෙරටින් හමුවන පැරණිම කාසි ................................ ලෙස හැඳින්වේ.**

1. කහාපණ    2. ලක්ෂ්මී කාසිය
3. අකනම් රන් කාසිය    iv. ස්වස්ථික කාසිය

09) **අතීතයේදී ජනතාව විසින් අත්හැර දැමූ ගම් .......................... යනුවෙන් හඳුන්වා ඇත.**

1. නියම්ගම්    2. පට්ඨාන ගාම
3. ඔලගම්    4. වාපිගාම

10) **දඹුලු විහාරයේ පර්වතයක ඇති සෙල්ලිපිය පිහිටවූ ................ රජතුමා එහි තමන් හඳුන්වාදී තිබෙන්නේ නරේෂ්වර යන නමිනි.,**

1. වළගම්බා    2. කුටකණ්ණ අභය
3. පළමුවන කාශ්‍යප    4. දෙවන අග්බෝ

11) **වැව් අමුණු තනවා ආර්ථිකයට කළ මෙහෙය නිසා ................... රජු මින්නේරිය දෙවියන් ලෙස පූජනීයත්වයට පත්ව ඇත,**

1. මහසෙන්    2. ධාතුසේන
3. වසභ    4. පාණ්ඩුකාභය

12) **පරුමකවරුන්ට රජයේ ඉහළ තනතුරු ලබා දී දේශපාලන බලය මධ්‍යගත කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කළ රජතුමා වන්නේ ,**

1. පණ්ඩුකාභය    2. දේවානම්පියතිස්ස    3. වසභය    4. දුටු ගැමුණුය

13) **හේන් වගා කිරීම වෙනුවෙන් අයකළ බදු වර්ග අහෝසි කළ රජෙකු ලෙස සැලකෙන්නේ,**

1. දෙවන සේන
2. දෙවන මුගලන්
3. මහා පරාක්‍රමබාහු
4. නිශ්ශංකමල්ල

14) **මීට වසර 2000කට පමණ පෙර පැවති නීතිය සම්බන්ධයෙන් හසල දැනුමක් ඇති පුද්ගලයින් හඳුන්වා ඇත්තේ,**

1. වෙජ යන නමිනි
2. ලපනවරු යන නමිනි
3. වොහාර නමිනි
4. අචාර්යවරු නමිනි

15) **අතීත ශ්‍රී ලංකාවේ දියුණු වෛද්‍ය තාක්ෂණයක් පැවති බවට ප්‍රබල සාධකයක් වන්නේ,**

1. පුරා විද්‍යාත්මක කැනීම්වලින් ශෛල්‍ය වෛද්‍ය උපකරණ හමුවීම
2. පැරණි වෙදපොත් මෙරට භාවිතයේ පැවතීමයි
3. වෛද්‍යවරු ලෙස ප්‍රසිද්ධියට පත් රජවරු පිළිබඳව වංශකතාවල සඳහන් වීමයි
4. අතීත රෝහල් ගොඩනැගිලි වල නටබුන් හමුවීමයි.

16) **සුළඟින් හා වැවක ඇතිවන තරංග නිසා වැව් බැම්මට වන හානිය වළක්වා ගැනිමට තනා ඇති වාරි අංගය වන්නේ,**

1. පිටවාන
2. සොරොව්ව
3. රළපනාව
4. බිසෝකොටුව

17) **දැදිගම අත්පහන හමුවන සුතිඝර චෛත්‍ය පිහිටි ප්‍රදේශයේ ඉපදී ඇති රජතුමා ලෙස සැලකෙන්නේ,**

1. පළමුවන විජයබාහු
2. පළමුවන පරාක්‍රමබාහු
3. පළමුවන භුවනෙකබාහු
4. පළමුවන ගජබාහු

18) **දෙවන නාගරිකරණය යටතේ බිහිවූ රාජ්‍ය අනුපිළිවෙල නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ,**

1. යාපහුව, කුරුණෑගල, දඹදෙනිය, කෝට්ටේ, ගම්පොළ
2. කුරුණෑගල, ගම්පොළ, කෝට්ටේ, යාපහුව, දඹදෙනිය
3. දඹදෙනිය, ගම්පොළ, කුරුණෑගල, යාපහුව, කෝට්ටේ
4. දඹදෙනිය, යාපහුව, කුරුණෑගල, ගම්පොළ, කෝට්ටේ

19) **පෘථිවිය ගෝලාකාරබවත් අනෙකුත් ග්‍රහයන් සූර්යයා වටා පරිභ්‍රමණය වන බවත් සොයාගැනීම නිසා නූතන තාරකා විද්‍යාවේ පියා ලෙස ගෞරවයට පත් වූ විද්‍යාඥයා කවුද?**

1. ජොහැන්නස් කෙප්ලර්
2. නිකලස් කොපර්නිකස්
3. අයිසෙක් නිව්ටන්
4. මයිකල් සර්වෙටස්

20) පහළොස්වන සියවසේදී දේශගවේෂණ කටයුතු වල නිරතවූවන් **X** තිරුවේද ඔවුන් විසින් ගොඩබසින ලද ප්‍රදේශය **Y** තිරුවේද දැක්වේ. **X** හා **Y** තීරු ගළපා නිවැරදි පිළිතුරු තෝරන්න,

| | **X** | | **Y** |
|---|---|---|---|
| 1. | වස්කෝද ගාමා | A | සුභපැත්මේ තුඩුව |
| 2. | පර්ඩිනාන්ට් මැගලන් | B | හිස්පැනියෝලාව |
| 3. | ක්‍රිස්ටෝපර් කොළොම්බස් | C | පිලිපීනය |
| 4 | බර්තොලමියු දියස් | D | ඉන්දියව |

1. A, C, D, B 2. C, D, B, A
3. D, C, B, A 4. D, C, A,B

21) පෘතුග්‍රීසින් තම පෙරදිග පාලන මුලස්ථානය ලෙස තෝරාගත් නගරය වන්නේ,

1. ගෝව 2. බතාවිය 3. මධුරාසිය 4. කරිකාල්

22) පළමුවන විමලධර්මසූරිය රජු විසින් දන්ත ධාතුන් වහන්සේ මහනුවරට වැඩමවීමට පෙර සඟවා තබා තිබුන විහාරය වන්නේ කුමක්ද?

i. දඹුලු විහාරයයි 2. කැළනි විහාරයයි
3. දෙල්ගමුව විහාරයයි 4. රිදි විහාරයයි

පහත වගුවේ A සිට H දක්වා ඇති තොරතුරු ඇසුරින් 23 හා 24 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| ශිල්පියා | සොයා ගන්නා ලද නිර්මාණය |
|---|---|
| A ඩෙම්ලර් | E ගුවන් විදුලි යන්ත්‍රය |
| B රොබට් බැක්වෙල් | F මෝටර් රථය |
| C ගුග්ලි මාර්කෝනි | G සත්ව අභිජනනය |
| C රිචඩ් ආක්රයිට් | H ගුවන්යානය |

23) ප්‍රවාහන ක්ෂේත්‍රයට සම්බන්ධවූ ශිල්පියා හා ඔහු විසින් සොයාගන්නා ලද නිර්මාණය
දැක්වෙන නිවැරදි පිළිතුර කුමක්ද?

1. A හා H 2. A හා F
3. D හා G 4. B හා E

24) සන්නිවේදන ක්ෂේත්‍රයට සම්බන්ධ වු ශිල්පියා හා ඔහු විසින් සොයා ගන්නා ලද නිර්මාණය ඇතුළත් නිවැරදි පිළිතුර කුමක්ද?

1. D හා H 2. B හා F
3. D හා G 4. C හා E

25) **ලොව පුරා ඇතිවූ කාර්මික විප්ලවය නිසා එම රටවල දේශපාලන සමාජ හා ආර්ථික යන ක්ෂේත්‍රවල ඇතිවූ වෙනස්කම් කීපයක් A, B, C, D වශයෙන් දක්වා ඇත. ඒ අනුව දේශපාලන හා ආර්ථික ක්ෂේත්‍ර තුළ ඇතිවූ වෙනස්කම් පමණක් පිළිවෙලින් දැක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න,**

A - වෘත්තීය සංගම් බිහිවීම
B - පරිසර දූෂණය
C - බද්ධ ව්‍යාපාරය හා බහු ජාතික සමාගම් බිහි වීම.
C - පන්ති සහිත සමාජයක් බිහි විම

1. A, D 2. A, C 3. C, C 4. A, B

26) **කාර්මික විප්ලවය බ්‍රිතාන්‍යයෙහි ආරම්භවීමට බලපෑ හේතුවක් නොවන්නේ,**

1. වෙළදාම දියුණුවීම
2. යුරෝපයේ වෙනත් රටවලද මේ වන විට කාර්මික විප්ලවය ආරම්භ වී තිබීම
3. ජනගහණය වර්ධනය විම නිසා භාණ්ඩ සඳහා ඉල්ලුම වැඩිවීම
4. බ්‍රිතාන්‍ය සතුව ඛනිජ සම්පත් බහුලව තිබිම

27) **කාර්මික විප්ලවය ශ්‍රී ලංකාව කෙරෙහිද බලපෑ අතර මාර්ග ඉදිකිරීම සඳහා මැකඩම් ක්‍රමය යොදාගැනිම දක්නට ලැබේ. ඒ අනුව කොළඹ මහනුවර මාර්ගය ඉදිකරන ලද්දේ කුමන ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයාගේ කාලයේද?**

1. තෝමස් මෙට්ලන්ඩ් 2. එඩ්වර්ඩ් බාන්ස්
3. හර්කියුලිස් රොබින්සන් 4. විලියම් ග්‍රෙගරි

28) **1600 දී පමණ ඉන්දියාවට පැමිණි විලියම්ස් හෝකින්ස් ප්‍රමුඛ නැව් කණ්ඩායම වෙළඳ කටයුතු පිළිබඳ සාකච්ඡා පවත්වනු ලැබුවේ කුමන මුගල් පාලකයා සමගද?**

1. ජහන්ගිර්
2. මහා අක්බාර්
3. සාජහන්
4. ඖරන්ෂේබ්

29) **පහත දැක්වෙන අ තීරුවේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ අනුව ආ තීරුවේ යෝජනා ගැළපුවිට ලැබෙන නිවැරදි පිළිතුර කුමක්ද?**

| අ | ආ |
|---|---|
| 1 කෝල්බෲක් | A සර්වජන ඡන්ද බලය ලැබීම |
| 2 ඩොනමෝර් | B ප්‍රථමවරට සර්වජන ඡන්දබලය ලබා දීම |
| 3 කෲමැකලම් | C ශ්‍රී ලංකාව පළාත් පහකට බෙදා දැක්වීම |
| 4 සෝල්බරි | D අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයක් පත් කිරිම |

i .A, B, C, D 2. C, B, D, A 3. C,A, B, D 4. D, A,C, B

30) **ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනය සම්බන්ධයෙන් නොගැළපෙන ප්‍රකාශය තෝරන්න,**

1. වතු වගාවේ ප්‍රතිඵලයක් වශයෙන් ගමනාගමන හා සන්නිවේදන කටයුතු දියුණුවක් ඇතිවිය.
2. දේශීය වෙදකම හා පිරිවෙන් අධ්‍යාපනය නඟා සිටුවීමට රජය උනන්දු නොවීය.
3. ඉංග්‍රීසි අධ්‍යාපනය ආරම්භ වීම නිසා උගත් මධ්‍යම පන්තියක් බිහිවිය.
4. දේශීය කර්මාන්ත හා යැපුම් කෘෂිකර්මයේ සංවර්ධනය කෙරෙහි දැඩි අවධානයක් යොමු විය.

31) **උඩරට රාජධානිය ඉංග්‍රීසින්ට යටත්කරගැනීම සඳහා උපායශීලීව කටයුතු කළ ඉංග්‍රීසි නිළධාරියා වන්නේ කවුරුන්ද?,**

1. මැක්ඩෝවල් 2. ජෝන් ඩොයිලි
3. හියුබොයිඩ් 4. මේජර් ලුඩවික්

32) **1818 දී ඉංග්‍රීසින්ට විරුද්ධව ඇතිවූ ප්‍රථම නිදහස් සටනට බලපෑ ආසන්නතම හේතුව ලෙස සැලකෙන්නේ,**

1. හජ්ජිමරික්කාර් නම් මුස්ලිම් ජාතකයෙකු මුහන්දිරම් තනතුරකට පත් කිරීම
2. බුද්ධාගම නොසලකා හැරීම
3. උඩරට සම්ප්‍රදායික සිරිත් විරිත් අභාවයට යෑම
4. දිවයින පුරා සුරාසල් ආරම්භ කිරීම

33) **මිෂනාරි පූජකතුමන්ලා සමග වාද විවාද පැවැත්වීමේදී පෙරමුණ ගෙන කටයුතු කළ බෞද්ධ භික්ෂූන් වහන්සේ වන්නේ,**

1. වාරියපොළ සුමංගල හිමි
2. පොතුවිල ඉන්ද්‍රජෝති හිමි
3. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි
4. වස්කඩුවේ සුභූති හිමි

34) **කොළඹ සහිරා විද්‍යාල ආරම්භ කිරීමේ ගෞරවය හිමිවන්නේ,**

1. සිද්දි ලෙබ්බේතුමාය 2. ටී.බී. ජයා මහතාටය
3. එම්.එම්. මොහොමඩ් මහතාටය 4. ඔරාබි පාෂාටය

35) **1912 පැවති මැතිවරණයෙන් ව්‍යවස්ථාදායක සභාවට තේරීපත්වූ උගත් ලාංකික නියෝජිතයා වන්නේ,**

1. පී. කුමාරස්වාමි 2. පොන්නම්බලම් රාමනාදන්
3. පොන්නම්බලම් අරුණාචලම් 4. ඒ.අමිර්තලිංගම්

36) **ඒ.ඊ ගුණසිංහ, නඩේසන් අයියර් යන නායකයින් දෙදෙනාටම සම්බන්ධ පොදුකරුණ පහත දී ඇති ප්‍රකාශ අතරින් තෝරන්න,**

1. නිදහස දිනාගැනීමේදී පුරෝගාමී මෙහෙවරක් කිරීම
3. සංස්කෘතික ප්‍රබෝධයක් ඇතිකිරීමට නායකත්වය දීම
3. දේශීය කෘෂිකර්මාන්තය නඟා සිටුවීමට ජනතාව උනන්දු කිරීම
4. කම්කරුවන් ඔවුන්ගේ වෘත්තීය අයිතිවාසිකම් දිනාගැනීමට මෙහෙයවීම

37) **මෙරට දුප්පත් ජනතාවට ආධාරදීමේ අරමුණෙන් පිහිටවූ සූරිය මල් ව්‍යාපාරය ආරම්භ කිරීමට මුල් වී කටයුතු කළ වාමාංශික නායකයින් දෙදෙනෙකු අඩංගු පිළිතුර කුමක්ද?,**

1. ඇන්.අම් පොරේරා සහ කොල්වින් ආර්ද සිල්වා
2. ඇන්.අම්. පෙරේරා සහ ඩී.එස්. සේනානායක
3. ජෝන් කොතලාවල හා එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක
4. ජේ.ආර් ජයවර්ධන සහ ඩඩ්ලි සේනානායක

38) **බ්‍රිතාන්‍ය පාලන සමය තුළදී වතුවගාවේ දියුණුවට මෙන්ම දේශීය කෘෂිකර්මාන්තයේ පරිහානියටද හේතුවක් වන්නේ,**

1. අනිවාර්ය සේවා රාජකාරී ක්‍රමය අහෝසි කිරීමය
2. ඉන්දියානු කම්කරුවන්ගේ ශ්‍රමය ලබා ගැනීමය
3. සිවිල් සේවකයන්ට පෞද්ගලික ව්‍යාපාරවල යෙදීමට ඉඩ සැලැස්වීමය
4. රජයේ පාලන ඒකාධිකාරය අහෝසි කිරීමය

39) **පාරම්පරිකව උඩරට සිංහලයන් විසින් භුක්ති විඳගෙන ආ ඉඩම් ඔවුනට අහිමි වීමට බලපෑ ප්‍රධාන හේතුවනම්,**

1. මහමාර්ග සෑදීම | 2. මුඩුබිම් පනත පැනවීම
3. කෝපිවගාව ව්‍යාප්ත වීම | 4. දුම්රිය මාර්ග ඉදිවීම

40) **සෝල්බරි ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුවට මහජන ඡන්දයෙන් තේරී පත්වූ මන්ත්‍රීන්ගේ සංඛ්‍යාව,**

1. 61 2. 101 3. 95 4. 225

| පිළියන්දල අධ්‍යාපන කලාපය<br>**Education Zone - Piliyandala** | | | |
|---|---|---|---|
| වර්ෂ මැද ඇගයීම - 2017<br>**Mid Year Evaluation** | | | |
| ශ්‍රේණිය<br>**Grade** } 11 | විෂයය<br>**Subject** } ඉතිහාසය | පත්‍රය<br>**Paper** } II | කාලය<br>**Time** } පැය 03යි |

නම ................................................ විභාග අංකය ......................

**සැළකිය යුතුයි:**

- ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් යුක්තය
- 1 කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්යය වේ.
- දෙවන කොටසින් ප්‍රශ්න හතරකට ද තුන්වන කොටසින් එක් ප්‍රශ්නයකට ද පිළිතුරු සපයන්න.

**1 කොටස**

01) අ) **පහත i යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහිද ii යටතේ දක්වා ඇති ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහිද ලකුණු කර නම් කරන්න.**

i. කැළණි ගඟ, යාන්ඔය, මහනුවර, යෝධවැව, මඩකලපුව, රාවණා ඇල්ල, දඹකොළ පටුන, කෝට්ටේ, යාපනය, සිතුල්පව්ව, ගිම්හතිත්ථ, පාහියන්ගල

( ලකුණු 12 යි. )

ii. කොන්ස්තන්තිනෝපලය, රෝමය, සියම්දේශය, පර්සියන් බොක්ක, කල්කටාව, බතාවිය

( ලකුණු 06 යි. )

ආ) **පහත A, B, C හා D යටතේ දක්වා ඇති තොරතුරු වලට සම්බන්ධ පුද්ගලයින් ලියා දක්වන්න.**

i. **A** දුටුගැමුණු රජුගෙන් පසු බලයට පත්වූ ඔහුගේ සොහොයුරා කවුද?

**B** රුවන්වැලිසෑය සැරසීම සඳහා රෝමයෙන් රතු පබළු ගෙන්වූ රජතුමා කවුද?

**C** ශ්‍රී ලංකාවට නිදහස් අධ්‍යාපනය හඳුන්වා දුන් නිදහස් අධ්‍යාපනයේ පියා ලෙස සැලෙකෙන නායකයා කවුරුන්ද ?

**D** ධනවාදය විග්‍රහ කරමින් රාජ්‍ය නිර්බාධවාදය නම් සංකල්පය ඉදිරිපත් කළ ආර්ථික විද්‍යාඥයා කවුරුද?

( ලකුණු 04 යි. )

**A, B** යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න

A



ii .

01. මෙම රූපයේ සිටින මෙරට බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරයට සම්බන්ධ නායකයා කවුරුන්ද?

02. එතුමා විසින් බෞද්ධාගම නගා සිටුවීමේ අරමුණින් පිහිටුවන ලද සංගමය කුමක්ද?

03. එතුමාගේ මූලිකත්වයෙන් නිදහස් කර ගන්නා ලද ඉන්දියාවේ පිහිටි බෞද්ධ සිද්ධස්ථානය කුමක්ද?

04. මෙතුමා සමගින් මෙරට බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරයේ දියුණුවට කටයුතු කළ ඇමරිකානු ජාතික නායකයා කවුරුන්ද?

( ලකුණු 04 යි. )

B



iii .

01. මෙම රූපයෙන් දැක්වෙන රජතුමා කවුරුන්ද?

02. එතුමා විසින් පාලනය කළ රාජධානිය කුමක්ද?

03. මේ රජුගේ අණින් මෙරට සිර දඬුවම් විඳි ඉංග්‍රීසි ජාතිකයා නම් කරන්න

04. ඉහත රජුගේ ක්‍රියා කලාපයක් නිසා ජනවහරට එකතු වූ ප්‍රස්ථා පිරුළ ලියන්න.

( ලකුණු 04 යි. )

## 2 කොටස

02)

i . ශ්‍රී ලංකාවේ ඉතිහාසය ඉගෙනීමට අධාරකරගත හැකි සංදේශ කාව්‍ය තුනක් නම් කරන්න.

( ලකුණු 04 යි. )

ii . පහත සඳහන් විදේශීය සාහිත්‍ය මූලාශ්‍ර වල කතුවරුන් නම් කරන්න

**A** නැචුරාලිස් හිස්ටෝරියා ( ලකුණු 04 යි. )

**B** ඩිමුන්ඩෝ

iii . පුරා විද්‍යාත්මක මූලාශ්‍රය ආරක්ෂා කර ගත යුත්තේ ඇයිදැයි කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

( ලකුණු 05 යි. )

iv . ඉතිහාසය විෂය ඉගෙනීමෙන් ලබාගත හැකි ප්‍රයෝජන තුනක් කෙටියෙන් විස්තර කරන්න.

( ලකුණු 06 යි. )

03) i. මෙරට ශිලාලිපි වල සඳහන් තොරතුරු වලට අනුව පහත A, B, හා C යන එක් එක් පුද්ගලයන්ගේ තනතුරු නාම අනුපිළිවෙලින් ලියා දක්වන්න.

A - පවුලක ප්‍රධානියා
B - ගමක ප්‍රධානියා
C - ගම් කිහිපයක ප්‍රධානියා ( ලකුණු 03 යි. )

ii. මධ්‍යම පාලනයට සම්බන්ධ පහත සඳහන් කාර්යභාර වූ තැනැත්තාගේ නිල නාම මොනවාදැයි වරහන් තුළින් තෝරා A, B, C හා D අනුපිළිවෙලින් ලියා දක්වන්න.

A - භෝජනාශාලා අධිකාරී
B - රාජ්‍ය ලේඛණාගාර ප්‍රධානි
C - කාසි අච්චු ගැසීමේ අංශ ප්‍රධානි
D - වත්සිරිත් හා චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳ අධිකාරී

(නගරගුතික, බතගු, කොතුරුගැතා, වෙදනා, කනපෙඩික, හති අදෙක, රූප අදෙක )

( ලකුණු 04 යි. )

iii. මෙරට අතීත රජවරුන්ගේ ක්‍රියාකලාපය හා ජනතාව ඉදිරියේ පෙනී සිටීමට උත්සහ කළ ස්වරූපය අනුව ගොඩනඟා ඇති රාජ්‍යත්ව සංකල්ප දෙකක් පැහැදිලි කරන්න

( ලකුණු 05 යි. )

iv. පළමුවන විජයබාහු රජුගේ ශ්‍රේෂ්ඨත්වය කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න ( ලකුණු 06 යි. )

04) i. පහත A, B, හා C යන කරුනුවලට අදාළව ඉදිවී ඇති ඇළ මාර්ගය සඳහන් කරන්න.

A - කලාවැවේ සිට තිසා වැවට ජලය ගෙන යෑමට ධාතුසේන රජතුමා විසින් ඉදිකළ ඇළ මාර්ගය
B - මහියංගනයට නුදුරෙන් මහවැලි ගඟ හරස් කර ඉදිකළ අමුණකින් පොළොන්නරුව තෙක් ජලය ගෙන යෑමට ඉදිකළ ඇළ මාර්ගය
C - මහවැලි ගඟේ අතුගංගාවක් වූ අඹන්ගඟ හරස්කර මින්නේරිය හා ගිරිතලේ යන වැව්වලට ජලය ගෙනයාමට ඉදිකළ ඇළ මාර්ගය ( ලකුණු 03 යි. )

ii. අපේ පැරැන්නන් ගොවිතැන සඳහා ඉඩම් මැනිමට යොදාගත් මිම් වර්ග හතරක් නම් කරන්න ( ලකුණු 04 යි. )

iii. පැරණි සමාජය විධිමත්ව හා යහපත්ව පවත්වාගෙන යාමට පාලකයන් විවිධ නීති පනවා ඇති බව පෙනේ. මේ අනුව පහත A හා B කරුණු යටතේ පනවා තිබූ නීති පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න.

A - බදු නීතිය
B - අපරාධ නීතිය ( ලකුණු 05 යි. )

iv. පැරණි සමාජයේ ජිවත් වූ වැසියන් දේශීය ආහාර වර්ගවලට මුල්තැන දී කටයුතු කළ ආකාරය පැරණි ආහාර වර්ග තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. ( ලකුණු 06 යි. )

05) i. ප්‍රංශ ජාතිකයන් විසින් ඉන්දියාවේ පිහිට වු වෙළඳ මධ්‍යස්ථාන තුනක් නම් කරන්න.

( ලකුණු 03 යි. )

ii . ශ්‍රී ලංකාවේ ත්‍රිකුණාමලය වරාය කෙරෙහි ඉංග්‍රීසින්ගේ අවධානය යොමුවීමට බලපෑ කරුණු දෙකක් සඳහන් කරන්න.

( ලකුණු 04 යි. )

iii . පෘතුග්‍රීසීන්ට හා ලන්දේසීන්ට උඩරට රාජධානිය අත්පත් කරගැනීමට නොහැකි වුයේ ඇයි දැයි කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

( ලකුණු 05 යි. )

iv . 1848 දී ඉංග්‍රීසි ආණ්ඩුවට විරුද්ධව මෙරට ඇතිවූ දෙවන නිදහස් සටන පිළිබඳව

A - කැරැල්ලේ නායකයින්
B - කැරැල්ලට බලපෑ හේතු
C - කැරැල්ල ආසාර්ථක වීමට බලපෑ හේතු

යන කරුණු ඔස්සේ කෙටි විස්තරයක් කරන්න.

( ලකුණු 06 යි. )

06) i. පහත සඳහන් A, B, හා C යන පිරිවෙන් ආයතන පිහිටුවීමට මුල්වූ භික්ෂූන් වහන්සේලා පිළිවෙලින් සඳහන් කරන්න.

A - රත්මලානේ පරමධම්මචේතිය පිරිවෙන
B - පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන
C - මාළිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන

( ලකුණු 03 යි. )

ii . මෙරට බෞද්ධ ආගමික පුනරුද ව්‍යාපාරය තුළ පහත A හා B යන ක්ෂේත්‍රවලට සම්බන්ධ පුද්ගලයන් නම් කරන්න.

A - නවකතා මගින් බටහිර සංස්කෘතිය හා මධ්‍යාසාර භාවිතයේ විපාක පෙන්වාදුන් නවකතාකරු
B - නාට්‍ය මගින් මධ්‍යාසාර භාවිතයේ විපාක පෙන්වාදුන් නාට්‍ය ශිල්පියා

( ලකුණු 04 යි. )

iii . හෙන්රි ස්ටීල් ඕල්කට්තුමාගෙන් මෙරට බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරයට සිදුවූ සේවය කරුණු දෙකක් ඔස්සේ පැහැදිලි කරන්න.

( ලකුණු 05 යි. )

iv . හින්දු හා ඉස්ලාම් ආගමික පුනර්ජීවන ව්‍යාපාරයේ ලා එහි නායකයන් දෙදෙනෙකු නම් කොට ඔවුන් විසින් එම ආගම්වල යහපත සඳහා සිදුකළ සේවය කෙටියෙන් විස්තර කරන්න.

( ලකුණු 06 යි. )

07) i. අදටත් ශ්‍රී ලංකාවට විදේශ විනිමය උපයාදෙන ප්‍රධාන අපනයන භෝග තුනක් වන තේ, රබර් හා පොල් සඳහා පර්යේෂණ ආයතන පිහිටුවා ඇති නගර පිළිවෙලින් දක්වන්න.

( ලකුණු 03 යි. )

ii . ශ්‍රී ලංකාවේ තේ වගාව දියුණුවීමට බලපා ඇති හේතු හතරක් ලියන්න.
( ලකුණු 04 යි. )

iii . බ්‍රිතාන්‍ය පාලන සමය තුළ මෙරට සිදුවූ සමාජ වෙනස්වීම් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.
( ලකුණු 05 යි. )

iv . වසර 133ක් ශ්‍රී ලංකාවේ පැවති බ්‍රිතාන්‍ය පාලනය නිසා ඇතිවූ යහපත් හා අයහපත් ප්‍රතිඵල උදාහරණ සහිතව විස්තර කරන්න.
( ලකුණු 106 යි. )

**3 කොටස**

08) i . යුරෝපයේ ඇතිවූ පුනරුදය තුළ පහත සඳහන් නිර්මාණ බිහිකළ පුද්ගලයන් පිළිවෙළින් නම් කරන්න.

A - මොනාලිසා චිත්‍රය
B - දුරදක්නය
C - මුද්‍රණ යන්ත්‍රය
( ලකුණු 03 යි. )

ii . යුරෝපා පුනරුද සමයේ දේශ ගවේෂණ කටයුතු සාර්ථක වීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න.
( ලකුණු 04 යි. )

iii . යුරෝපයේ පුනරුදය ඇති වීමට බලපෑ හේතු දෙකක් කෙටියෙන් විස්තර කරන්න.
( ලකුණු 05 යි. )

iv . ශ්‍රී ලංකාවේ පහත A, B, හා C වශයෙන් දක්වා ඇති ක්ෂේත්‍ර කෙරෙහි යුරෝපා පුනරුදය බලපෑ ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

A - දේශපාලන
B - ආර්ථික
C - සමාජ හා සංස්කෘතික ( ලකුණු 06 යි. )

09) i . බ්‍රිතාන්‍යයේ කාර්මික විප්ලවය සිදුවූ ප්‍රධාන කර්මාන්ත තුන සඳහන් කරන්න.
( ලකුණු 03 යි. )

ii . කාර්මික විප්ලව සමයේ පහත සඳහන් නව නිර්මාණ ලොවට හඳුන්වාදුන් පුද්ගලයන් නම් කරන්න.


A - ජල බලයෙන් ක්‍රියාකරන නූල් කටින යන්ත්‍රය
B - වානේ නිපදවීමේ උඳුන
C - වාෂ්ප එන්ජිම
D - ආරක්ෂක ලාම්පුව
( ලකුණු 04 යි. )

iii . පළමුව කාර්මික විප්ලවය බ්‍රිතාන්‍යයෙන් ආරම්භවීමට බලපෑහේතු දෙකක් පැහැදිලි කරන්න. ( ලකුණු 05 යි. )

iv . කාර්මික විප්ලවය නිසා සිදුවූ අහිතකර ප්‍රතිඵල තුනක් විස්තර කරන්න.
( ලකුණු 06 යි.

1. (අ) (i)
1. (அ) (i)
1. (a) (i)

විභාග අංකය
சுட்டெண்
Index No. ..............................



1. (අ) (ii)
1. (அ) (ii)
1. (a) (ii)

